**ශීර්ෂය 285 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 285 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) වාණිජ අත්තිකාරම් ගිණුම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | පැල්වෙහෙර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.791,608 ක ණයගැති ශේෂය රු.79,168 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ණයගැති ශේෂය රු.712,440 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් පිළියෙළ කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වීම. |
| ii. | පොළොන්නරුව බීජ නිෂ්පාදන ගොවිපලේ සමාලෝචිත වර්ෂය තුළ අපහරණය කර තිබුණු යන්ත්‍රවලට අදාළ සමුච්චිත ක්ෂය වටිනාකම රු. 4,638,657 ක් වුවත්, එය රු.3,478,042 ක් ලෙස රු.1,160,615 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ප්‍රත්‍යාගණිත අගයන් ගිණුම් තුලට ගැනීමෙන් අනතුරුව නිවැරදි කරන බව. | සමුච්චිත ක්ෂය නිවැරදිව හඳුනාගෙන ගිණුමට ගැලපිය යුතුය. |
| iii. | උඩරුදැල්ල බීජ නිෂ්පාදන ගොවිපලේ සමාලෝචිත වර්ෂය අවසානයේ තොග තක්සේරු වාර්තාවේ අනෙකුත් පාරිභෝගිත ද්‍රව්‍ය තොගයේ වටිනාකම රු. 968,093 ක් වුවත්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.1,816,959 ක් ලෙස දැක්වීම හේතුවෙන් අනෙකුත් පාරිභෝගික ද්‍රව්‍ය තොගය රු.848,866 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | තොග නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| iv. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සංවර්ධන ගිණුම යටතේ හඳුනාගෙන තිබුණු රු.57,500,314 ක යන්ත්‍ර හා උපකරණ තොගයක් සමාලෝචිත වර්ෂය තුල ගොවිපල් අත්තිකාරම් ගිණුමට මාරු කර තක්සේරු කිරීමකින් තොරව පිරිවැය මත රු.1,437,507 ක ශේෂයක් ගොවිපල් අත්තිකාරම් ගිණුමේ වර්ෂයේ ක්ෂය වශයෙන් ගිණුම් ගත කර තිබුණි. | තක්සේරු කර ඉදිරියේදී ගිණුම්ගත කරන බව. | වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| v. | සමාලෝචිත වර්ෂය තුල අපහරණය කරන ලද ස්ථාවර වත්කම් වලට අයත් රු.24,364,021 ක සමුච්චිත ක්ෂය, ක්ෂය සංචිත අරමුදල ගිණුම හර කර තිබුණද සමුච්චිත අරමුදල් ගිණුමට බැර කර නොතිබුණි. | අතපසුවීමකින් ජ'නල් සටහනක් ගිණුම්ගත කර නොමැති බව. | අපහරණය කරන ලද ස්ථාවර වත්කම්වලට අදාළ ක්ෂය නිවැරදිව අදාළ ගිණුම්වලින් ඉවත් කළ යුතුය. |

**(ආ) ගනුදෙනු බේරා අවසන් කිරීමේ අත්තිකාරම් ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මුදල් රෙගුලාසි 518(3) ප්‍රකාරව අත්තිකාරම් කාර්යය වසා දැමීමෙන් පසු එළඹෙන වර්ෂයේදී ඇවර කිරීමේ කටයුතු නිම කළ යුතු වුවද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පැවති වාණිජ අත්තිකාරම් කටයුතු 05 ක් 1991 සිට 2002 දක්වා කාලය තුල අමාත්‍ය මණ්ඩල තීරණයක් මත වසා දැමීමට තීරණය කර තිබුණි. එසේ වාණිජ අත්තිකාරම් ගිණුම වසා දමා වර්ෂ 20 ත් 31 ත් අතර කාලයක් ගත වී ඇතත්, ඇවර කිරීමේ කටයුතු නිම කර ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි | මුදල් රෙගුලාසි 513 අනුව ගිණුම් කාරක සභාවේ නිර්දේශය අවශ්‍ය බව. | මුදල් රෙගුලාසි 518(3) අනුව ඇවර කිරීමේ කටයුතු නිම කර ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

**(ඇ) දේපල පිරියත හා උපකරණ**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| i. | මූල්‍ය ප්‍රකාශන (ඒසීඒ - 6) අනුව මූල්‍ය නොවන වත්කම් යටතේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හඳුනාගෙන තිබූ වාහනවල වටිනාකම රු.1,600,904,975 ක් වුවද, දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කළ ලේඛනවලට අනුව එය රු.1,605,524,742 ක් වූයෙන් රු.4,619,766 ක වෙනසක් පැවතුණි. | මෙම වෙනස නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| ii. | මූල්‍ය ප්‍රකාශන (ඒසීඒ - 6) අනුව මූල්‍ය නොවන වත්කම්වල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි සහ ඉදිකිරීම් රු. 7,119,325,465 ක් වුවද, භෞතිකව තහවුරු කරගෙන තිබුණු වටිනාකම අනුව එය රු. 1,809,182,290 ක් විය. ඒ අනුව එකතුව රු. 5,310,143,175 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද ගොඩනැගිලි සහ ඉදිකිරීම් අවස්ථා 1248 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ගොඩනැගිලි වටිනාකම ඉදිරියේදී තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | වත්කම් නිවැරදිව තක්සේරු කළ යුතු අතර වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| iii. | මූල්‍ය ප්‍රකාශන (ඒසීඒ - 6) අනුව මූල්‍ය නොවන වත්කම්වල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම්වල වටිනාකම රු.17,849,002,464 ක් වුවද, භෞතිකව තහවුරු කරගෙන තිබුණු වටිනාකම අනුව එය රු. 11,664,574,116 ක් විය. ඒ අනුව එකතුව රු. 6,184,428,348 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් 372 ක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් වටිනාකම ඉදිරියේදී තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම් හඳුනාගෙන ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

**(ඇ) අත්තිකාරම් ගිණුම් ශේෂ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට අනුව **(ACA - F)** සමාලෝචිත වර්ෂයේ අත්තිකාරම් ලැබීම් හා අත්තිකාරම් ගෙවීම් පිළිවෙලින් රු.1,348,571,573 ක් හා රු.1,294,318,401 ක් ලෙස දක්වා තිබුණද භාණ්ඩාගාර සටහන් අනුව අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු.1,349,780,930 ක් හා රු.1,294,573,401 ක් වූ බැවින් අත්තිකාරම් ලැබීම් රු.1,209,357 ක් හා අත්තිකාරම් ගෙවීම් රු.255,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | දත්ත කිහිපයක් අතහැර තිබීම නිසා මෙම ගිණුම්කරණ අඩුපාඩුව සිදුව ඇති බව. | භාණ්ඩාගාර පොත් සමග සසඳා ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------ | ------------- |
| මූල්‍ය ප්‍රකාශන බැඳීම් හා බැරකම් පිළිබඳ සටහන (iv) අනුව 2022 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් ශේෂය රු. 7,251,091 ක් බව දක්වා තිබුණද භාණ්ඩාගාර මුද්‍රිත SA 92 ලේඛනය අනුව 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.15,098,673 ක් විය. | තාක්ෂණික දෝෂයක් හේතුවෙන් භාණ්ඩාගාර මුද්‍රිතවල 2022 වර්ෂයට අදාළ බැරකම් සිගාස් වැඩ සටහනින් ඉවත් වී නොමැති බව. | අවශ්‍ය නිවැරදි කිරීම් පිළිබඳව කටයුතු කිරීමට භාණ්ඩාගාරයට දැනුම් දිය යුතුය. |

### 2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------ | ------------- |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විගණන පෙන්වා දීම අනුව ඉදිරියේදී කටයුතු කරන බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| රාජ්‍ය සේවා කොමිසම් සභා කාර්යය පරිපාටික රීති 1 කාණ්ඩයේ XVIII වන පරිච්ඡේදයේ 193 වන ඡේදය | දෙපාර්තමේන්තුවේ ඒකක 7 කට අනුයුක්ත නිලධාරීන් 183 දෙනෙකු වසර 5 කට වැඩි කාලයක් එකම ආයතනයක සේවය කරමින් පැවැතුණි. | නව බඳවා ගැනීම් වලින් පසු ස්ථාන මාරු පටිපාටියට යටත්ව ස්ථාන මාරු කිරීමට කටයුතු කරන බව. | කාර්ය පරිපාටික රීති හා විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.4 අවිධිමත් ගනුදෙනු**

**අධිකාර බලය නොමැති ගෙවීම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | මු.රෙ. **753(2)** ප්‍රකාරව කටයුතු නොකර ගන්නෝරුව උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය රු. 1,900,734 ක රසායනාගාර මේස මිලදී ගැනීමේදී භාණ්ඩ ලැබී නොතිබියදී, ගබඩා භාර නිලධාරියා විසින් භාණ්ඩ ලැබුණු බවට ව්‍යාජ ලෙස දක්වා පොදු 219 නිකුත් කර තිබුණි. 2023 මාර්තු 15 දින වන විටත් අදාළ භාණ්ඩ ලැබී නොතිබුණු අතර ඒ වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දිනැතිව ලියන ලද රු.1,900,734 ක චෙක්පතක් දින 75 ක කාලයක් ව්‍යාපෘති ගිණුම් අංශයෙහි රඳවාගෙන තිබුණි. | වවුචර් පත් ඉදිරිපත් කිරීමේදී අදාළ කාල සීමාව තුලදීම බිල්පත් ඉදිරිපත් කර ගෙවීම් කටයුතු සිදු කිරීමට හැකිවන පරිදි ආයතන කටයුතු විධිමත් කිරීමට අදාළ අංශ වෙත අවවාද ලිපි යොමු කළ බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ ලැබීමෙන් පසු ගෙවීම් සිදු කළ යුතුය. |
| ii. | රජයේ බීජ අර්තාපල් නිෂ්පාදන ගොවිපල් 03 ක් සඳහා මිලදී ගැනීමට සැලසුම් කර තිබුණු Front end Loaders 03 ක් සඳහා අවස්ථා 03 කදී එකතුව රු. 9,449,925 ක් ගෙවා තිබුණි. ඊට අදාළ චෙක්පත් 2023 පෙබරවාරි 28 දින වන විට නිෂ්කාශනය වී ඇතත් ව්‍යාජ පොදු 219 සහතික මත ගෙවීම් කර තිබුණු අදාළ උපකරණ 2023 මාර්තු 30 දින වන විටත් ගොවිපල් වෙත ලැබී නොතිබුණි. | වවුචර් පත් ඉදිරිපත් කිරීමේදී අදාළ කාල සීමාව තුලදීම බිල්පත් ඉදිරිපත් කර ගෙවීම් කටයුතු සිදු කිරීමට හැකිවන පරිදි ආයතන කටයුතු විධිමත් කිරීමට අදාළ අංශ වෙත අවවාද ලිපි යොමු කළ බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ ලැබීමෙන් පසු ගෙවීම් සිදු කළ යුතුය. |

## 2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුමකට අදාලව සමාලෝචිත වර්ෂයේ අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාලය තුල ව්‍යාපෘති කාර්යයන් වෙනුවෙන් ලියන ලද රු. 10,309,346 ක චෙක්පත් 26 ක් අදාළ ආදායකයා වෙත නිකුත් නොකර පරීක්ෂා කළ දිනය වූ 2023 මාර්තු 15 දින වන විටත් ගිණුම් අංශය තුල රඳවා ගෙන තිබුණි. | වවුචර්වල අඩුපාඩු සම්පූර්ණ කර කඩිනමින් ගෙවීම් කටයුතු සිදු කරන බව. | අදාළ කාර්යයන් ඉටු වූ පසු ගෙවීම් කළ යුතුය |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බීජ නිෂ්පාදන ගොවිපලෙහි ප්‍රධාන අරමුණ ගුණාත්මක බීජ නිෂ්පාදනය වුවද, ප්‍රරෝහණ ප්‍රතිශතය සියයට 50 – 75 දක්වා වූ බීජ අනුමත මිලෙන් සියයට 50 ක් අඩුකර හා ප්‍රරෝහණ ප්‍රතිශතය සියයට 25 - 50 අතර පවතින බීජ අනුමත මිලෙන් සියයට 75 ක් අඩුකර ගොවීන්ට නිකුත් කර තිබුණි. | ප්‍රරෝහණ ප්‍රතිශතය අඩු බීජ ව්‍යාපෘති සඳහා පමණක් ලබා දුන් බව. | කෘෂිකාර්මික කටයුතු සඳහා ප්‍රරෝහණ ප්‍රතිශතය වැඩි බීජ ලබා දිය යුතුය. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුණ්ඩසාලේ රජයේ බීජ නිෂ්පාදන ගොවිපලට අවශ්‍ය බීජ නියමිත කාල සීමාව තුළ ලබා ගැනීමට කටයුතු නොකිරීමෙන් කන්න 04 ක අවස්ථා 16 කදී බෝග වර්ග 07 කට අදාළව අපේක්ෂිත බීජ කි.ග්‍රෑ 4810 ක නිෂ්පාදනයක් සිදුකිරීමට නොහැකි වි තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අපේක්ෂිත බීජ නිෂ්පාදන ඉලක්කය සපුරා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මහඉලුප්පල්ලම බීජ නිෂ්පාදන ගොවිපලේ 2019 වර්ෂයේ යල කන්නයේ සිට 2022 යල කන්නය දක්වා වූ කන්න 07 ක අපේක්ෂිත මුළු වී බීජ නිෂ්පාදනය කි.ග්‍රෑ.3,067,620 ක් වුවත්, එම කාලය තුල රු. 86,001,891 ක්, වැය කර වී බීජ කි.ග්‍රෑ.1,400,265 ක් හෙවත් අපේක්ෂිත නිෂ්පාදනයේ සියයට 46 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි. එමෙන්ම එම කාල පරිච්ඡේදය තුල අපේක්ෂිත මුළු අතිරේක ආහාර බෝග බීජ නිෂ්පාදනය කි.ග්‍රෑ.51,040 ක් වුවත් රු.23,875,563 **ක** පිරිවැයක් දරා අතිරේක ආහාර බෝග බීජ කි.ග්‍රෑ.10,823 **ක්** හෙවත් අපේක්ෂිත නිෂ්පාදනයෙන් සියයට 21 **ක්** පමණක් නිෂ්පාදනය කර තිබුණි. | ඉන්ධන අර්බුධය, රසායනික පොහොර නොලැබීම, කෘෂි රසායන වෙළඳපොලෙහි නොතිබීම, ජල සැපයුම් ගැටළු ආදිය පැවතීම හේතුවෙන් ඉලක්කගත නිෂ්පාදනය කරා ලඟාවීමට නොහැකි වූ බව. | ඉලක්කගත බීජ නිෂ්පාදනය ලබා නොගැනීමට හේතු වූ සාධක අවම කර ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 224 වගන්තිය ප්‍රකාරව කටයුතු කර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආයතන 10 කට අදාළ හෙක්ටයාර් 2191 ක භූමි ප්‍රමාණයක් විධිමත්ව පවරාගෙන නොතිබුණි. | ඉඩම් පවරා ගැනීමට ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතන 10ක පවතින එකතුව රු. 116,976,640 ක යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ 261 ක් වසර 01 ත් 07 ත් දක්වා කාල පරාසයක සිට භාවිතයට නොගෙන නිශ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවතුණි. | පවතින ප්‍රතිපාදන සැළකිල්ලට ගෙන අළුත්වැඩියා කිරීමට කටයුතු කරන බව හා අපහරණ තත්ත්වයේ පවතින යන්ත්‍රෝපකරණ අපහරණය කරන බව. | නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත යන්ත්‍රෝපකරණ අළුත් වැඩියා කර උපයෝජනයට ගැනීමට හෝ අපහරණය කළ යුතුය. |
| (ඇ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත විවිධ අමාත්‍යාංශ**,** දෙපාර්තමේන්තු හා ව්‍යාපෘති මගින් ලැබී තිබුණු ආයතන 09 ක පවතින යතුරු පැදි 23 ක් හා ඒකක 46 කට අදාළ අත් ට්‍රැක්ටර් හා ට්‍රැක්ටර් 105 ක් 2022 නොවැම්බර් 30 දින වන විටත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ නමින් ලියාපදිංචි කර නොතිබුණි. | ලියාපදිංචි කර අදාළ අංක තහඩු ලබා ගැනීමට කටයුතු කරන බව. | සියළු වාහන අධ්‍යක්ෂ ජනරාල් නමට ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දෙපාර්තමේන්තුවේ වාහන 72 ක් හා යතුරු පැදි 183 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි | ඉදිරියේදී ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරන බව. | දෙපාර්තමේන්තුව සතු සියළු වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | දෙපාර්තමේන්තුවේ ඒකක 11 කට අයත් අත් ට්‍රැක්ටර්, ට්‍රැක්ටර් හා කොළ මඩින යන්ත්‍ර 40 ක් අපහරණය සඳහා යොමු කර ඇතත් 2022 වර්ෂය වන විටද ඒවායේ අපහරණයන් සිදුකර නොතිබුණි. | ඉදිරියේදී අපහරණය සඳහා කටයුතු කරන බව. | වාහන අපහරණයට අදාළ කටයුතු කාර්යක්ෂමව සිදු කළ යුතුය. |
| (ඊ) | දෙපාර්තමේන්තුවේ ඒකක 72 කට අදාළව රජයේ නිවාස 396 ක් භාවිතයට ගැනීමකින් තොරව නිෂ්කාර්යයව පැවතුණි. | ලැබෙන ප්‍රතිපාදන අනුව අළුත්වැඩියා කර ඉදිරියේදී භාවිතයට ගන්නා බව. | අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | සේනා දළඹු ව්‍යාප්තිය අධ්‍යයනය හා ඒ පිළිබඳ සොයා බැලීම සඳහා කෘෂිකාර්මික යාන්ත්‍රිකරන පර්යේෂණ මධ්‍යස්ථානය වෙත රු. 6,395,847 ක් ගෙවා 2019 දෙසැම්බර් 20 දින ඩ්‍රෝන කැමරා පද්ධතියක් මිලදී ගෙන තිබුණි. නමුත් මෙම කැමරා පද්ධතියෙන් අපේක්ෂිත කාර්යය ඉටු කර ගැනීම සඳහා ඩ්‍රෝන මෘදුකාංගය ස්ථාපිත කිරීම වෙනුවෙන් අවශ්‍ය ඩෙස්ට්ටොප් පරිගණකයක් මිලදී ගැනීමට නොහැකි වීම හේතුවෙන් මෙම කැමරාව වසර 03 කට අධික කාලයක් නිෂ්කාර්යව පැවතුණි. | අදහස් දක්වා නොමැත. | අවශ්‍යතාවයන් සම්පූර්ණ කර අදාළ පද්ධතිය භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 පාඩු හා හානි

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | ----------------------------- | ------------- |
| මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත් හැරීම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණු මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ කටයුතු අවසන් නොකළ 1976 වර්ෂයේ සිට පවතින රු.104,443,743 ක හානි හා පාඩු සිද්ධි 383 ක් සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අලාභයන්ට අදාළ වගකිව යුතු නිලධාරීන්ගෙන් අය කර ගැනීම සම්පූර්ණ නොවීම මු.රෙ. 109 යටතේ පොදු 285 වාර්තා අනුමත නොවීම මේ සඳහා හේතු වූ බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව හානි හා පාඩු සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------- | ---------------------- | ----------------- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1981 නොවැම්බර් 02 දිනැති අංක 165/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 6 වන ඡේදය ප්‍රකාරව කොළඹ, කටුනායක, ත්‍රිකුණාමලය, තලෙයිමන්නාරම, ගාලු හා කන්කසන්තුරේ වරායන්හි ශාක නිරෝධායන සේවයේ කටයුතු සිදු කර නොතිබුණි. | වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් ලැබී නැති බව. | ගැසට් නිවේදනයේ විධිවිධානයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | කුණ්ඩසාලේ රජයේ බීජ නිෂ්පාදන ගොවිපලට අයත් අංක 6656 දරන පිඹුර මගින් වෙන්කර තිබුණු අක්කර 1.5 කට අයත් ඉඩම් කොටස් 21 ක් අනවසර පදිංචි කරුවන් භාවිතා කර ඇති අතර එයින් කොටස් 2 ක ස්ථිර ඉදිකිරීම් සිදුකර තිබුණි. | ඉඩම් කොටස් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | අනවසර පදිංචි කරුවන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කුණ්ඩසාලේ රජයේ බීජ නිෂ්පාදන ගොවිපළේ කුඩා පරිමාණ වැව් 11 ක රොන්මඩ ඉවත් කිරීමේ අවශ්‍යතාවය 2019 වර්ෂයේ සිට හඳුනාගෙන වසර 04 ක කාලයක් ගත වී ඇතත්, මෙම වැව්වල රොන්මඩ ඉවත් කිරීමේ කටයුතු සිදු කර නොතිබුණි. | රොන් මඩ ඉවත් කිරීමේ කටයුතු ඉදිරියේදී සිදුකරන බව. | සැළසුම්ගත කාර්යයන් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | මහඉලුප්පල්ලම රජයේ බීජ නිෂ්පාදන ගොවිපලේ කාබනික පොහොර නිෂ්පාදනය සඳහා ඉකුත් වර්ෂයේ දෙසැම්බර් මස රු.1,709,800 කට මිලදීගත් චොපර් මැෂින් 03 ක් ලබා දී තිබුණද 2023 ජනවාරි 12 දින වන විටත් මෙම යන්ත්‍ර කාබනික පොහොර නිෂ්පාදනයට යොදාගෙන නොතිබුණි. | ඉදිරියේදී භාවිතා කිරීමට සැළසුම් කර ඇති බව. | අදාළ යන්ත්‍ර අරමුණුගත කාර්යයකට යොදාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | මහඉලුප්පල්ලම නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයට අයත් ගබඩා 06 ක ගබඩා කර තිබුණු බීජ වී කිලෝග්‍රෑම් 273508 ක ප්‍රමාණයකින් බීජ වී කිලෝග්‍රෑම් 239991 ක ප්‍රමාණයක් හෙවත් මුළු බීජ වී ප්‍රමාණයෙන් සියයට 88 ක් අසමත් බීජ බව බීජ සහතික කිරීමේ සේවය සහතික කර තිබුණි. | මාස 09 කට වඩා බීජ කල්ගත වීම නිසා පැළ වීමේ ප්‍රතිශතය අඩු විය.ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් මග හැරවීමට කටයුතු කරන බව. | බීජ කල් ඉකුත් වීමට පෙර කඩිනමින් භාවිතය සඳහා යොමු කළ යුතුය. |
| (ඊ) | දෙපර්තමේන්තුවේ ඒකක 54 කට අනුයුක්ත කර තිබුණු අත් ට්‍රැක්ටර්, ට්‍රැක්ටර් හා කොළ මඩින යන්ත්‍ර 139 ක් හා ඒකක 32 කට අනුයුක්ත කර තිබුණු යතුරු පැදි 84 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරු කර ගිණුම්ගත කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | ------------------------ | ------------ |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විශ්‍රාමිකයින් 303 ක ගේ විශ්‍රාම වැටුප් ලිපිගොනුවල වැඩ අවසන් නොවීම මත විශ්‍රාම වැටුප් ගෙවීමට නොහැකි වී තිබුණි. | විශ්‍රාම වැටුප් ලිපිගොනුවල අඩුපාඩු සහ වර්තමාන තත්ත්වය පිළිබඳ සොයා බලා කටයුතු කරන බව. | විශ්‍රාම වැටුප් ලිපිගොනුවල කටයුතු අවසන් කර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |